" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone } 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/18-38/FI/02-2023 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } දිනය / திகதி / Date } 2023.04. 12

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.04.12 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | 2022.09.13 සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ 01-28/2022 | ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි වෛද්‍ය පරිපාලකවරුන්, වෛද්‍ය උපදේශකවරුන්, වෛද්‍ය නිලධාරීන් හා දන්ත වෛද්‍යවරුන් සඳහා දේශීය විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම. |
| 02. | 2023.03.23 රා.ප.චක්‍රලේඛ 03/2023 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2023 |
| 03. | 2023.04.06 රා.ප.චක්‍රලේඛ 06/2023 | 2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් වෙත වැටුප් ගෙවීම. |

02. මෙම චක්‍රලේඛවල පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 03/2023

මගේ අංකය : CS/SLAS/ANN.TRA/SP-2023
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.03.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානින්

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2023

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 251 රීතියේ විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයින් සඳහා මෙම ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කරනු ලැබේ.

### 01. වාර්ෂික ස්ථාන මාරු කමිටුව පත් කිරීම හා එහි ක්‍රියාවලිය

ස්ථාන මාරු පටිපාටියේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්ගේ 2023 වර්ෂයට අදාළව ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුව මෙම අමාත්‍යාංශය මඟින් පත් කරනු ලැබේ. මෙම කමිටුවේ කාර්යභාරය වනුයේ ස්ථාන මාරු අපේක්ෂිත නිලධරයන්ගේ ඉල්ලීම් සලකා බැලීම, නිලධරයන් වෙත සාධාරණ කාල පරාසයන් තුල ස්ථාන මාරුවීම් ක්‍රමානුකූලව ලබා දීම සහ එකම සේවා ස්ථානයක නිලධරයන් දීර්ඝ කාලයක් තිස්සේ රැඳී සිටීම වැළැක්වීම පිණිස අදාළ නිලධාරීන් පිළිබඳව ස්ථාන මාරුවීම් කළ යුතු ආකාරය පිළිබඳව යෝජනා කිරීම වේ.

### 02. ස්ථාන මාරුවීම් කමිටුවේ සංයුතිය

මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විතව ස්ථාන මාරු කමිටුව පත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| I. | වෙනත් අමාත්‍යාංශයක ලේකම්වරයෙක් | - | සභාපති |
| II. | මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) | - | සාමාජික |
| III. | අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා පරිපාලන සේවා ශාඛාව | - | සාමාජික |
| IV. | ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ නියෝජිතයෙක් | - | සාමාජික |

**03. වාර්ෂික ස්ථාන මාරු කමිටු යෝජනාවලට එරෙහිව කරුණු දැක්වීමේ අවස්ථාව**

ඉහත සඳහන් ස්ථාන මාරු කමිටුව මඟින් කරනු ලබන යෝජනා පිළිබඳව කරුණු දැක්වීම සඳහා එකී යෝජනා සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන නිලධරයන් වෙත අවස්ථාවක් ලබා දෙනු ලබන අතර එම නිලධාරීන්ට ලිඛිතව තම කරුණු දැක්වීම අභියාචනයක් ලෙස මෙහි අංක 11 හි සඳහන් ලිපිනයට, ස්ථාන මාරු කමිටුව විසින් දන්වනු ලබන දිනට පෙර එවිය යුතු ය. ඉන් අනතුරුව එම කරුණු දැක්වීම් පහත සඳහන් කමිටුව මඟින් සමාලෝචනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| I. | මෙම අමාත්‍යාංශයේ ලේකම් | - | සභාපති |
| II. | ස්ථාන මාරු කමිටුවට ඇතුළත් නොවූ වෙනත් අමාත්‍යාංශයක ලේකම්වරයෙකු | - | සාමාජික |
| III. | මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) | - | සාමාජික |

***සටහන***
***මෙම චක්‍රලේඛය අනුව ස්ථාන මාරු සිදු කළ ද යම් සුවිශේෂී හේතුවක් මත නිලධරයකුට ලබා දී ඇති ස්ථාන මාරු පිළිබඳව නැවත සලකා බැලිය හැකි ය. එසේ කරනුයේ ස්ථාන මාරු කරන ලද නිලධරයන් විසින් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ සමඟ ඉහත සඳහන් ස්ථාන මාරු සමාලෝචන කමිටුවට ඉල්ලීමක් ඉදිරිපත් කළහොත් පමණි.***

**04. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර**

පහත සඳහන් නිලධරයන් මේ චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරු කිරීම සඳහා සලකා බලනු ලැබේ.

I. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කිරීම් කරනු ලැබූ නිලධරයන් හැර අනෙකුත් විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් අතුරින්, එක් සේවා ස්ථානයක <u>එනම් අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක / ආයතනයක හෝ පළාත් සභාවක</u> අවම වශයෙන් වසර හය (06) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් මෙම පටිපාටිය පරිදි ස්ථාන මාරුවීම් සඳහා යටත් වනු ඇත

II. පහත අංක 07 හි සඳහන් පරිදි ප්‍රිය මනාප සේවා ස්ථානයක නියමිත උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන්

III. එක් සේවා ස්ථානයක අවම වශයෙන් වසර දෙක (02) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් තම කැමැත්ත මත

**05. ආයතන ප්‍රධානීන්ගේ එකඟතාවය අනුව ස්ථාන මාරු වීම්වලට යටත් වන ආයතන**

මෙම චක්‍රලේඛය යටතේ පහත සඳහන් සේවා ස්ථානවල සේවය කරනු ලබන විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් ස්ථාන මාරු කිරීම සඳහා සලකා බලනුයේ අදාළ ආයතන ප්‍රධානීන් එම නිලධාරීන් ස්ථාන මාරු කිරීමට එකඟ වන්නේ නම් පමණි.

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
II. මැතිවරණ කොමිෂන් සභාව
III. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
IV. මුදල් කොමිෂන් සභාව
V. ජාතික වැටුප් කොමිෂන් සභාව
VI. සීමා නිර්ණය කොමිෂන් සභාව

**06. වාර්ෂික ස්ථාන මාරු කමිටු විසින් කටයුතු නොකළ යුතු ආයතන**

පහත සඳහන් ආයතනවල සේවය කරනු ලබන නිලධරයන්ගේ ස්ථාන මාරු එම ආයතනයන්ගේ ස්වභාවය සලකා මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය යටතේ සලකා බලනු නොලැබේ.

I. ජනාධිපති කාර්යාලය
II. අග්‍රාමාත්‍ය කාර්යාලය
III. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය
IV. සභානායක කාර්යාලය
V. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
VI. විපක්ෂ නායක ලේකම් කාර්යාලය

**07. ප්‍රියමනාප සේවා ස්ථාන වර්ගීකරණය**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු පවතින සහ දිරි දීමනා ගෙවනු ලබන පහත සඳහන් ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවය කළ හැකි උපරිම සේවා කාලය ඒ ඉදිරියෙන් දක්වා ඇත.

| | | |
|---|---|---|
| I. | රේගු දෙපාර්තමේන්තුව | - අවුරුදු 03 යි |
| II. | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | - අවුරුදු 03 යි |
| III. | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - අවුරුදු 03 යි |
| IV. | සුරාබදු දෙපාර්තමේන්තුව | - අවුරුදු 03 යි |

*සටහන*

***(i)*** ***මෙහි අනු අංක II ,III හා IV යටතේ සඳහන් වන ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කළ හැකි උපරිම කාල සීමාවන් ඉහත දක්වා ඇති පරිදි ක්‍රියාත්මක වනුයේ 2018 සහ ඉන් ඉදිරි වර්ෂවලට අදාළ වාර්ෂික ස්ථාන මාරු නියෝග සඳහා පමණි.***

***(ii)*** ***කිසියම් නිලධරයෙකුට තම සමස්ත සේවා කාලය තුළ ඉහත සඳහන් දෙපාර්තමේන්තු අතුරින් එක් ස්ථානයක පමණක් සේවය කිරීමට අවස්ථාව ලබා දෙනු ඇත.***

**08. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේ දි සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

I. මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවයට හා වර්තමාන සේවා ස්ථානවල සේවය කළ හැකි සේවා කාලයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

II. වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය. (උදා:- 2023 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2022.12.31 දිනට)

III. යම් සේවා ස්ථානයක සේවය කළ කාලය ගණන් ගැනීමේ දී, නිලධරයකුගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

IV. ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ ස්ථාන මාරුවීම් වලට විරුද්ධව කරනු ලබන කරුණු දැක්වීම් ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

V. යම් ආයතනයක වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම නිලධාරීන් විසින් ස්ථාන මාරු අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර එසේ ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් නොකරන නිලධාරීන් ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමති සේ සලකා කටයුතු කරනු ලැබේ.

VI. ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයන්, නියමිත දිනයේදි නව රාජකාරි ස්ථානය වෙත වාර්තා කිරීමට බැඳී සිටින අතර, වාර්ෂික ස්ථාන මාරු කමිටුව මඟින් දෙපාර්තමේන්තුවෙන් / අමාත්‍යාංශයෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ අදාළ ආයතන ප්‍රධානීන් ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතු ය.

VII. ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධරයකු එම මාරුවීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම මෙම මාරු පටිපාටියට පටහැනි කරුණකි.

VIII. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධරයකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(V) වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

**09**. අදාළ ආකෘති පත්‍රවල මෘදු පිටපත් පහත දැක්වෙන පරිදි මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

| www.pubad.gov.lk → සේවා → ශ්‍රී ලංකා පරිපාලන සේවය → බාගත කිරීම් |
|---|

**10. වාර්ෂික ස්ථාන මාරුවීම් පටිපාටියෙන් පරිබාහිර අවස්ථා**

මෙම ස්ථාන මාරුවීම් පටිපාටියට බාහිරව සිදුකරන විශේෂ ස්ථාන මාරු ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ / පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමට හේතු වූ කරුණු පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම් මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් එම ඉල්ලීම් සලකා බලා තීරණයක් ලබා දෙනු ඇත.

**11. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

I. මෙම චක්‍රලේඛයේ "ඇමුණුම I" හි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සකස් කළ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සහ ඊට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් මෙම චක්‍රලේඛයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව, නියමිත දිනට පෙර පහත ලිපිනයට යොමු කළ යුතු වේ.

**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**
**නිදහස් චතුරස්‍රය**
**කොළඹ 07.**

II. ඒ ඒ ආයතන විසින් මෙම චක්‍රලේඛයේ ප්‍රකාරව ස්ථාන මාරු කිරීමට අපේක්ෂා කරනු ලබන නිලධාරීන් සම්බන්ධ විස්තර මෙහි "ඇමුණුම II" හි සඳහන් ආකෘති පත්‍රය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතුය. එසේම, තම ආයතනවල ස්ථාන මාරුවීම් නොලැබ වසර හය (06) ක් හෝ එයට වඩා වැඩි කාලයක් සේවය කරනු ලබන නිලධාරීන් පිළිබඳ විස්තර "ඇමුණුම III" හි සඳහන් ආකෘති පත්‍රය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු වේ. තවද, මෙම චක්‍රලේඛයේ අංක 03 හි සඳහන් වාර්ෂික ස්ථාන මාරු

කමිටු යෝජනාවලට එරෙහිව කරුණු දැක්වීම මෙහි “ඇමුණුම IV” හි සඳහන් ආකෘති පත්‍රය ප්‍රකාරව ද ඉදිරිපත් කල යුතු වේ.

III. වාර්ෂික ස්ථාන මාරු කමිටු තීරණ හා සමාලෝචන කමිටු තීරණවලින් පසු වාර්ෂික ස්ථාන මාරුවීම්වල අවලංගු කිරීම්, සංශෝධනය කිරීම් සහ කල් දැමීම් පිළිබඳ සියලුම ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි “ඇමුණුම V” සහ “ඇමුණුම VI” හි සඳහන් ආකෘති පත්‍ර ප්‍රකාරව නියමිත දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතු ය.

## 12. වාර්ෂික නොවන ස්ථාන මාරු

පරිපාලනමය අවශ්‍යතා, සේවා අවශ්‍යතා සහ විනය හේතු මත මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ස්ථාන මාරු නියෝග නිකුත් කෙරේ. සාමාන්‍ය රාජකාරී කටයුතුවලට බාධාවක් නොවන සුහද ස්ථාන මාරු ඉල්ලීම්ද, නිලධරයන්ගේ හදිසි වූද, සානුකම්පිතව සලකා බැලිය යුතු වූ කරුණු අඩංගු ඉල්ලීම්ද, අමාත්‍යාංශ ලේකම්වරුගේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතිව ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය පියවර ගනු ලැබේ. එහෙත් වාර්ෂික ස්ථාන මාරු කමිටු වලදී හැර ශ්‍රී ලංකා පරිපාලන සේවා ශාඛාවේ දෛනිකව සිදු කෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ.

## 13. ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සිදු කිරීමේ කාලසටහන

මෙම ස්ථාන මාරු කිරීම් පහත සඳහන් වගුවේ ආකාරයට අදාළ කාල සීමාවන් තුළ සිදු කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගනු ඇත.

**ස්ථාන මාරු ක්‍රියාවලියට අදාල කාල සටහන**

| | කාර්යය | නියමිත දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව නාමිකව පිහිටුවීම | 2023 මාර්තු මස 24 වන දිනට පෙර |
| 02 | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම | 2023 මාර්තු මස 24 වන දිනට පෙර |
| 03 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | 2023 අප්‍රේල් මස 10 වන දිනට පෙර |
| 04 | අදාළ බලධාරියා* විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | 2023 අප්‍රේල් මස 12 වන දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා* වෙත ලිඛිතව භාර දීම | 2023 අප්‍රේල් මස 19 වන දිනට පෙර |
| 06 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව නාමිකව පත් කිරීම | 2023 අප්‍රේල් මස 21 වන දිනට පෙර |
| 07 | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | 2023 මැයි මස 08 වන දිනට පෙර |

| | | |
|---|---|---|
| 08 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා* වෙත ලිඛිතව භාර දීම | 2023 මැයි මස 29 වන දිනට පෙර |
| 09 | අවසාන ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම | 2023 ජුනි මස වන 02 දිනට පෙර |
| 10 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම | 2023 ජුනි මස 09 වන දිනට පෙර |
| 11 | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම | 2023 ජුනි මස 25 වන දිනට පෙර |
| 12 | සේවා ස්ථාන වලට මුදාහරින ලද, තම සේවා ස්ථානයට වාර්තා කරන ලද නිලධරයින් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීම | 2023 ජූලි මස 28 වන දිනට පෙර |

*සටහන*

**** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්***

**14. ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය**

I. ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය මෙහි දැක්වෙන "ඇමුණුම V" සහ "ඇමුණුම VI" හි සඳහන් ආකෘති පත්‍ර ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමට ද ඔහු ක්‍රියා කළ යුතු වන්නේ ය.

II. රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ මෙම අමාත්‍යාංශයේ ලේකම් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානී හා මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළ යුතු වන්නේ ය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

III. ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින **14** ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

IV. කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින **15** ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානී හා මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේ ය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි

පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ නියමිත දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

V. වාර්ෂික ස්ථාන මාරු තීරණ ලබා දී තිබිය දී එම තීරණයන්ට එරෙහිව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අභියාචනා ඉදිරිපත් කර නොමැති නිලධරයන්ගේ අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකළ යුතු වන්නේ ය.

VI. අදාළ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල සඳහන් විධිවිධාන අනුව වාර්ෂික ස්ථාන මාරුවීමක් අයදුම් කිරීම සඳහා අවශ්‍ය අවම සේවා කාලය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ගේ අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකළ යුතු වන්නේ ය.

VII. මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේ ය.

VIII. ඉහත 14(IV) උප වගන්තියෙහි සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසන් තීරණය ගනු ඇත්තේ ය.

IX. ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානී හා මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත යවනු ලබන්නේ ය.

X. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
දුරකථන : 0112 - 698605
ෆැක්ස් : 0112 - 683651
විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com

**ඇමුණුම I**

**ස්ථාන මාරු අයදුම්පත**

**(ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)**

1. පෞද්ගලික තොරතුරු

1.1. නම (පත්වීම් ලිපියේ පරිදි) : ..............................................................................................

1.2. නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමඟ : ...............................................................

1.3. සම්පූර්ණ නම : ..............................................................................................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................

1.5. උපන් දිනය :......................................

1.6. ස්ත්‍රී / පුරුෂ භාවය :......................................

1.7. මුල් පත්වීම් දිනය : ......................................

1.8. පෞද්ගලික ලිපිනය :

..............................................................................................................................

..............................................................................................................................

1.9. විවාහක /අවිවාහක බව :......................................

i. කලත්‍රයාගේ නම : ..........................................................................

ii. රැකියාව :......................................................

iii. සේවා ස්ථානය :......................................................

iv. දරුවන් පිළිබඳ විස්තරඃ දරුවන් පිළිබඳ තොරතුරු

| අංකය | දරුවන්ගේ නම් | වයස | ඉගෙනුම ලබන පාසැල් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

1.10. දුරකථන අංකයඃ :........................................................ නිවස : ...................... ජංගම ......................

2. වර්තමාන සේවා ස්ථානය :.........................................................................

2.1 අමාත්‍යාංශය/පළාත්සභාව :.........................................................

2.2 දෙපාර්තමේන්තුව/ පළාත් අමාත්‍යාංශය : .........................................................

2.3 කාර්යාලයීය ලිපිනය : ..............................................................................................

..............................................................................................

2.4 කාර්යාලයීය දුරකථන අංකය : ......................................

2.5 සේවයට වාර්තා කළ දිනය : ..........................

2.6 2022.12.31 දිනට සේවා කාලයඃ අවු :.............. මාස :............ දින :.............

3. තනතුර

3.1. වර්තමාන තනතුරු නාමය : ..................................................

3.2. එම තනතුරට පත්වූ දිනය : ..................................................

4. ස්ථාන මාරු ඉල්ලීමට හේතුව : ..........................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

5. පූර්ව සේවා ස්ථාන :

<table>
<tr><th rowspan="2">තනතුර</th><th colspan="2">සේවා ස්ථානය (ප්‍රියමනාප සේවා ස්ථානවල සේවා කාලයද ඇතුළුව)</th><th rowspan="2">කාල සීමාව</th></tr>
<tr><th>ආයතනය</th><th>ආයතනය අයත් වන දිස්ත්‍රික්කය</th></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
</table>

6. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථානː

<table>
<tr><th colspan="2">තනතුර</th><th>සේවා ස්ථානය</th></tr>
<tr><td>1</td><td></td><td></td></tr>
<tr><td>2</td><td></td><td></td></tr>
<tr><td>3</td><td></td><td></td></tr>
</table>

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය බවට සහතික කරමි. මා විසින් ස්ථාන මාරු ලැබීමට ඉල්ලා ඇති ඕනෑම සේවා ස්ථානයකට / එම ස්ථානවලට ඉතා ආසන්න ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමැත්ත මින් පළ කරන බවත් එම ඉල්ලීම මත, ලබා දෙන ස්ථාන මාරුව සඳහා නියෝග නිකුත් කළ පසු එම නියෝගය අවලංගු කිරීමට හිමිකමක් නොමැති බවත් පිළිගනිමි.

දිනය : ..................................................   අත්සනː ..................................................................

**ඇමුණුම II**

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් උපලේඛනය - ………….. වර්ෂය**

අමාත්‍යාංශය : ……………………………………………

| අනු අංකය | නිලධාරියාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීම් දිනය හා මාධ්‍යය | පෞද්ගලික ලිපිනය | උපන් දිනය හා 2022.12.31 දිනට වයස | පූර්ව සේවා ස්ථාන හා කාලසීමාව | මාරුවීම ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

සියලුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : නම : …………………………………………… අත්සන : ……………………………

පරීක්ෂා කළේ : නම : …………………………………………… අත්සන : ……………………………

දිනය : ………………

……………………………………………………

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගත හැකි නිලධාරියෙකුගේ

නම හා තනතුර : ……………………………

දුරකථන අංකය : ……………………………

**ඇමුණුම III**

**එක් සේවා ස්ථානයක අවුරුදු 06 කට වැඩි කාලයක් සේවය කර ඇති සියළුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සළකන්න. (2022.12.31 දිනට)**

**(වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සළකන්න).**

අමාත්‍යාංශය : ..............................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම : (මයා / මිය / මෙය යන්න සඳහන් කරන්න) | පත්වීම් දිනය | තනතුර / ශ්‍රේණිය හා මාධ්‍යය | උපන්දිනය හා 2022.12.31 දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2022.12.31 දිනට | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම් කර තිබේද? අයදුම් කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුණහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03ක් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

සකස් කළේ : නම : .............................................................................. අත්සන : ......................................

පරීක්ෂා කළේ : නම : .............................................................................. අත්සන : ......................................

දිනය : ...........................

..........................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගත හැකි නිලධාරියෙකුගේ

නම හා තනතුර : ........................................

දුරකථන අංකය : ........................................

ඇමුණුම IV

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් වලට විරුද්ධව කරුණු දැක්වීම් පත්‍රය</u>**

| ස්ථාන මාරුවීම් ලේඛනයේ අනන්‍යතා අංකය : ........................................ |
|---|

අමාත්‍යාංශය : ........................................

(අ) නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

1. I. නිලධාරියාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :
........................................
........................................ මයා / මිය / මෙනවිය

II. ස්ථිර ලිපිනය :
........................................

III. පදිංචි ස්ථානයේ ලිපිනය :
........................................

IV. 2023 වර්ෂයේ පදිංචි ස්ථානය වෙනස් වන්නේ නම් නව පදිංචි ස්ථානයේ ලිපිනය :
........................................

2. ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය : ........................................

3. තනතුර හා ශ්‍රේණිය : ........................................

3.1.සේවයට ඇතුළත් වු දිනය දිනය : ........................................

3.2. විශේෂ ශ්‍රේණියට ඇතුළත් වූ දිනය : ........................................

4. උපන් දිනය : ........................................

5.

| සේවා විස්තර | පත් වූ දිනය | සේවා ස්ථානය සිට / දක්වා |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |

6 මා ඉල්ලා සිටිනුයේ දී ඇති ස්ථාන මාරුවීම අවලංගු කිරීමටය / සංශෝධනය කිරීමටය

7. ස්ථාන මාරුවීම් වලට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් කිරීමට හේතු : (පසු පිටෙහි සඳහන් කරන්න)

8. ස්ථාන මාරුව සංශෝධනය කළ යුතු / ලබා දිය යුතු සේවා ස්ථානය :

අමාත්‍යාංශය : ........................................

දෙපාර්තමේන්තුව : ........................................

දිනය : ........................................ ........................................

නිලධාරියාගේ අත්සන

(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ :

I. කාර්යාල තොරතුරු අනුව ඉහත විස්තර නිවැරදි වේ.

II. මෙම ස්ථාන මාරුව අවලංගු කිරීම / සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන කරුණු දැක්වීම හා නිර්දේශය :

..............................................................................................................................................................................................

..............................................................................................................................................................................................

දිනය : ..............................................................

..............................................................
අමාත්‍යාංශ ලේකම් අත්සන

(අනවශ්‍ය වචන කපා හරින්න. සම්පූර්ණ තොරතුරු ඇතුළත් නොකළ අයදුම්පත් ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් සළකා බලනු නොලැබේ. වැඩි විස්තර ඇත්නම් පසුපිට සඳහන් කරන්න.)

**<u>ඇමුණුම V</u>**

## වාර්ෂික ස්ථානමාරු පිළිබඳ අභියාචනා -

2023 වාර්ෂික ස්ථානමාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - අභියාචක පිළිබඳ තොරතුරු

**අ. පෞද්ගලික තොරතුරු**

<table>
<tr><td>01. මුලකුරු සමඟ නම:-</td><td colspan="3"></td></tr>
<tr><td>02. තනතුර හා පන්තිය</td><td colspan="3"></td></tr>
<tr><td>03. උපන්දිනය :-YYYY/MM/DD</td><td>04. වයස :-<br>(2022.12.31<br>දිනට)</td><td>05. ජාතික හැඳුනුම් පත් අංකය:-</td><td>06. ස්ත්‍රී/පුරුෂ භාවය</td></tr>
<tr><td>07.ස්ථිර ලිපිනය :-<br><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:<br>දිස්ත්‍රික්කය:</td><td>08. තාවකාලික<br>ලිපිනය:-</td><td colspan="2">09. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :-</td></tr>
<tr><td>10. විවාහක /අවිවාහක බව</td><td>11. කලත්‍රයාගේ<br>නම:-</td><td colspan="2">12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:-</td></tr>
<tr><td>13. දරුවන් ගණන</td><td>14. ඔවුන්ගේ වයස:-</td><td colspan="2">15. ඉගෙනුම ලබන පාසැල්:-</td></tr>
</table>

**ආ. සේවා තොරතුරු**

<table>
<tr><td colspan="2">16. තනතුරට පත් වූ දිනය:-</td></tr>
<tr><td>17.වර්තමාන සේවා ස්ථානය :-</td><td>18.සේවා ස්ථානය පිහිටි නගරය:-</td></tr>
<tr><td>19.වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:-<br>YYYY/MM/DD</td><td>20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2022.12.31 දිනට)<br>අවු.......... මාස......... දින.......</td></tr>
<tr><td colspan="2">21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක/ ස්ථානවල සේවය කර තිබේ ද?</td></tr>
</table>

| **22.** රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | | ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | **1** | | | සිට | දක්වා |
| | **2** | | | | |
| | **3** | | | | |
| | **4** | | | | |
| | **5** | | | | |
| | **6** | | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න )

| **23** .වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන | |
|---|---|---|---|
| ඇත | නැත | **1** | |
| | | **2** | |
| | | **3** | |
| | | **4** | |
| | | **5** | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය : - | | | |
| ස්ථාන මාරු ලැබී ඇති සේවා ස්ථානයට, නිලධාරියා ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මි) **: -** | | | |

**24.** ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන :- **.......................................**

| **25.** ස්ථානමාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
|---|---|---|
| | නැත | |

**26.** නිලධාරියා මීට පෙර වර්ෂවලදී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කර තිබේද?

ස්ථාන මාරු ඉල්ලුම් කර ඇත්නම්, ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති වර්ෂ හා ඉල්ලුම් කර ඇති සේවා ස්ථාන

| ඉල්ලුම් කළ වර්ෂය | ඉල්ලුම් කරන ලද සේවා ස්ථාන |
|---|---|
| | |
| | |
| | |
| | |

**27.** ඉහත අංක 26 පරිදි ඉල්ලුම් කරන ලද වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධයෙන් ලැබී ඇති තීරණ:-

( ස්ථාන මාරුවක් ලැබී නොමැති නම් ඒ බවද සඳහන් කරන්න)

ඈ. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු:-

| 28. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම :- | | | |
|---|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කල සේවා ස්ථාන | |
| සංශෝධනය කිරීම | | **1** | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | **2** | |
| | | **3** | |

29. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :-

**ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය පිළිබඳ තොරතුරු :-**

30. ස්ථාන මාරු සමාලෝචක කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3 ..............................................................................................................................

**31.** ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම **(01)** ...........................................................................................................

ඇමුණුම **(02)** ...........................................................................................................

ඇමුණුම **(03)** ...........................................................................................................

**32.** ඉල්ලා සිටිනු ලබන සහන

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

........................................ ........................................................

දිනය අත්සන

ඇ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

නිලධාරියා / නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. .................. වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

i. ..........................................................................................................................

ii. ..........................................................................................................................

iii. ..........................................................................................................................

....................................... ................................................

දිනය අත්සන

උ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශය

I. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන: .........................................................................

II. අභියාචනය පිළිබඳ නිර්දේශය: .........................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

....................................... ................................................

දිනය අත්සන

**ඇමුණුම VI**

## වාර්ෂික ස්ථානමාරු පිළිබඳ අභියාචනා

2023 වාර්ෂික ස්ථානමාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම - චක්‍රයේ අනෙක් නිලධාරීන් පිළිබඳ තොරතුරු

**I.** අභියාචක නිලධාරයාගේ නම හා තනතුර:

.....................................................................................................................................

II. අභියාචක නිලධරයා අයත් ස්ථාන මාරු චක්‍රයේ සිටින අනෙක් නිලධාරීන් පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

<table>
<tr><td>01. මුලකුරු සමඟ නම:-</td><td colspan="4"></td></tr>
<tr><td>02. සේවය, තනතුර හා පන්තිය</td><td colspan="4"></td></tr>
<tr><td>03. උපන්දිනය :-YYYY/MM/DD</td><td>04. වයස :-<br>(2022.12.31 දිනට)</td><td colspan="2">05. ජාතික හැඳුනුම්පත් අංකය:-</td><td>06. ස්ත්‍රී/පුරුෂ භාවය</td></tr>
<tr><td>07.ස්ථිර ලිපිනය :-</td><td colspan="2">08. තාවකාලික ලිපිනය:-</td><td colspan="2">09. දුරකථන අංකය<br>කාර්යාලය :-<br>පෞද්ගලික :-</td></tr>
<tr><td>10. විවාහක /අවිවාහක බව</td><td colspan="2">11. කලත්‍රයාගේ නම:-</td><td colspan="2">12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:-</td></tr>
<tr><td>13. දරුවන් ගණන</td><td colspan="2">14. ඔවුන්ගේ වයස:-</td><td colspan="2">15. ඉගෙනුම ලබන පාසැල්:-</td></tr>
</table>

ආ. සේවා තොරතුරු

<table>
<tr><td colspan="2">16. තනතුරට පත් වූ දිනය:-</td></tr>
<tr><td>17.වර්තමාන සේවා ස්ථානය :-</td><td>18.සේවා ස්ථානය පිහිටි නගරය:-</td></tr>
<tr><td>19.වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය:-<br>YYYY/MM/DD</td><td>20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2022.12.31 දිනට)<br>අවු............ මාස............. දින..........</td></tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේ ද? | | | | | |
| **22.** රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | | සේවා ස්ථානය | ප්‍රිය මනාප / ප්‍රිය මනාප නොවන | සේවා කාලය | |
| | | | | සිට | දක්වා |
| | 1 | | | | |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න )

| | | | | |
|---|---|---|---|---|
| **23 .**මෙවර වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන | |
| | නැත | | 1 | |
| | | | 2 | |
| | | | 3 | |
| ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය : - | | | | |

| | | |
|---|---|---|
| **24.** ස්ථානමාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
| | නැත | |

| | | | |
|---|---|---|---|
| 25. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම :- | | | |
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කළ යුතු / නව ස්ථාන මාරුවීමක් ලබාදිය යුතු සේවා ස්ථාන | |
| සංශෝධනය කිරීම | | 1 | |
| ස්ථාන මාරුවක් ලබා ගැනීම | | 2 | |
| | | **3** | |

26. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :-

27.නිලධරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේද /නැතිද යන්න

**28.** අභියාචකගේ ඉල්ලීම ඉටු කළහොත් මෙම නිලධරයාට අගතියක් නොවන පරිදි ස්ථාන මාරු චක්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශය:-

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

............................................ ..........................................

දිනය ස්ථාන මාරු බලධරයාගේ අත්සන